**නගර සහ කඩවත් ප්‍රාදේශීය සභාව**
**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය**
**------------------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන
**-----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**--------------------------------**

2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මැයි 02 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මැයි 18 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2015 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 අගෝස්තු 12 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
**-------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට නගර සහ කඩවත් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
**------------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
**------------------------**

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන සමඟ හෙළිදරව්කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
**-----------------------**

පහත ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සභාවේ බැංකු ගිණුම් දෙකක් සම්බන්ධයෙන් 2015 දෙසැම්බර් 31 දින මුදල් පොත අනුව බැංකු ශේෂය පිළිවෙලින් රු. 231,859 ක් සහ රු. 442,909 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන අනුව එම දිනට බැංකු ශේෂය පිළිවෙලින් රු. 203,351 ක් සහ රු. 771,166 ක් වූයෙන් බැංකු ශේෂය රු. 299,749 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සේවක ණය ලේඛනය අනුව සේවක ණය ශේෂය රු. 6,993,565 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන අනුව සේවක ණය ශේෂය රු. 8,840,089 ක් වූයෙන් සේවක ණය ශේෂය රු. 1,846,524 කින් වැඩියෙන් දක්වා තිබුණි.

#### 1.3.3 ගෙවිය යුතු ගිණුම්
**---------------------**

2005 වර්ෂයේ සිට 2007 වර්ෂය දක්වාවූ කාලපරිච්ඡේදයේ සභාවේ සේවය කළ සේවකයන් 07 දෙනෙකුට ගෙවිය යුතු වැටුප් රු. 214,927 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ගෙවා නිම කිරීමට කටයුතු නොකර දිගටම මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

**1.3.4 විගණන සඳහා සාක්ෂි නොවීම**

**-----------------------------------**

අයකර ගත යුතු වරිපනම් බදු රු. 14,394,400 ක් සම්බන්ධයෙන් කාල විශ්ලේෂණය විගණනයට ඉදිරිපත්කර නොතිබුණි.

**1.3.5 නීති, රීති සහ රෙගුලාසි ආදියට අනුකූල නොවීම**

**---------------------------------------------------**

පහත දැක්වෙන නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| (i) මුදල් රෙගුලාසි 880 | මුදල් සහ ගබඩාව සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකීම් භාරදෙනලද නිලධාරින් හතර දෙනාගෙන් ආරක්ෂක ඇප මුදල් ලබාගෙන නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 571 | රු. 335,750 ක කල් ඉකුත්වූ තැන්පත් සම්බන්ධයෙන් විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි. |
| (ආ) 1988 වර්ෂයේ ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති X වන පරිච්ඡේදයේ රීති 193 | වර්ෂයේ තත්‍ය ආදායම් සහ වියදම් සම්බන්ධ විස්තර අයවැය ඇස්තමේන්තු සමඟ සසඳා විචලනයන් සඳහා හේතුන් ඇතුලත් කළ ප්‍රකාශයක් සකස්කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

**1.3.6 බලය නොලත් ගනුදෙනු**

**----------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ අංක 03/2014 දරන 2014 දෙසැම්බර් 30 දිනැති චක්‍රලේඛය අනුව ජාත්‍යන්තර දුරකථන පහසුකම් සභාවේ නිලධාරින් භාවිතා කරන්නේ නම් අදාල අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතුය. එයට පටහැනිව ලේකම්ගේ අනුමැතිය නොමැතිව සභාවේ සභාපති විසින් සමාලෝචිත වර්ෂයේ රු. 9,902 ක ජාත්‍යන්තර ඇමතුම් ලබාගෙන සහා අරමුදලින් ගෙවීම්කර තිබුණි.

(ආ) ඉහත චක්‍රලේඛයේ 02 ඡේදය අනුව සභාවේ ලේකම් විසින් පාවිච්චි කරන ලද නිවාස දුරකථන පහසුකම් සඳහා මසකට රු. 2,000 ක් බැගින් 2015 වර්ෂය සඳහා රු. 24,000 ක් ඔහුගේ වැටුප සමඟ ගෙවිය යුතුය. එසේ වූවද රු. 40,886 ක් ගෙවා තිබීමෙන් රු. 16,886 ක් වැඩිපුර ගෙවා තිබුණි.

## 2 මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2015 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂයේ ප්‍රදේශීය සභාවේ මෙහෙයුම්වලින් රු. 36,061,611 ක පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායමක් ලබා තිබූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ මෙහෙයුම් වලින් රු. 9,402,844 ක වියදම් ඉක්මවූ ආදායමක් තිබුණි.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාව විසින් ඉදිරිපත් කරන ලද සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම්, තත්‍ය ආදායම් සහ හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විස්තර | ඇස්තමේන්තුගත ආදායම් | තත්‍ය ආදායම් | 2015.12.31 දිනට හිඟය |
|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 |
| වරිපනම් හා බදු | 17,033 | 23,714 | 14,394 |
| බදුකුලි | 14,900 | 1,566 | 87 |
| බලපත්‍ර ගාස්තු | 9,582 | 1,617 | 130 |
| වෙනත් ආදායම් | 2,522 | 2,441 | 629 |

### 2.2.2 වරිපනම් සහ බදු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තිය අනුව සභා බල ප්‍රදේශයේ තිබෙන ඉඩම් සහ ඉදිකරන ලද නිවාස සහ ගොඩනැගිලි වලින් 2008 වර්ෂයේ සිට 2015 වර්ෂය අවසානය දක්වා අයකර ගතයුතු එකතුව රු. 14,394,400 ක වරිපනම් බදු අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

### 2.2.3 සන්නිවේදන කුළුනු ගාස්තු

සභා බල ප්‍රදේශයේ 2007 වර්ෂය සිට 2015 වර්ෂය දක්වා ස්ථාපිත කරතිබූ සන්නිවේදන කුළුනු 08 ක් වෙනුවෙන් ගාස්තු අය නොකිරීමෙන් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රු. 279,000 ක ආදායමක් සභාවට අහිමිවී තිබුණි.

### 2.2.4 උසාවි දඩ මුදල

-----------------

විවිධ ආඥා පනත් යටතේ මහේස්ත්‍රාත් උසාවියෙන් 2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු. 5,094,500 ක මුදල පළාත් සභාවේ ප්‍රධාන ලේකම්ගෙන් ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

## 3 මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) වෙනත් ආයතනවලින් පරිත්‍යාග වශයෙන් ලැබුනු වාහන 08 ක් වසර නවයකට වඩා වැඩි කාලයක් සභාව විසින් ධාවනයේ යොදවා තිබුණද, සභාවේ නමට පවරා ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ආ) 2005 වර්ෂයට පෙර පාඨකයන්ට කියවීම නිකුත්කරන ලද පුස්තකාල පොත් 3196 ක් ආපසු ලබාගෙන නොතිබුණි.

(ඇ) සභාවේ සේවකයන් 04 දෙනෙකුට ලබාදුන් රු. 82,318 ක් හිඟ ණය ශේෂය එම සේවකයන්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ටෝකියෝ සිමෙන්ති කර්මාන්ත ශාලාවෙන් 2015 වර්ෂය වෙනුවෙන් අයවියයුතු වරිපනම් බදු රු. 6,464,150 ක මුදලින් රු. 2,025,000 ක් පමණක් අයකර ගෙන තිබුණි.

(ඉ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය අනුව සභා බලප්‍රදේශයේ තිබෙන සංචාරක හෝටල්වලින් වාර්ෂික ආදායමින් 1% බලපත්‍ර ගාස්තු අයකර ගත යුතුය. ඒසේ වුවද, බලප්‍රදේශයේ තිබෙන සංචාරක හෝටල් 03 කින් සංචාරක හෝටල් 02 ක් බලපත්‍ර ගාස්තු අයකර නොතිබුණි.

(ඊ) 1999 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වාවූ කාලපරිච්ඡේදයතුල ආයතන 42 කට ලබා දී තිබූ අත්තිකාරම් මුදල ඒ අයගෙන් අයකර ගෙන තිබුණද මූල්‍ය ප්‍රකාශනවල දිගටම ලැබියයුතු රු. 2,131,856 ක අත්තිකාරම් ලෙස ඉදිරියට ගෙනවිත් තිබුණි.

### 3.2 ආර්ථිකමය නොවූ ගනුදෙනු

-------------------------------

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ 2011 පෙබරවාරි 24 දිනැති අංක 02/2011 දරන චක්‍රලේඛයේ 4.1 වගන්තිය අනුව, පළාත් පාලන ආයතනවල අනියම් සහ තාවකාලික පදනම යටතේ පත්කරන ලද සේවකයන්ගෙන් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. එසේ වුවද, මෙයට පටහැනිව සභාවේ සේවය කළ සේවකයින් වෙනුවෙන් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදල් සහ සේවක භාරකාර අරමුදලට දායක මුදල් ගෙවා තිබුණි. සේවකයින් දෙදෙනෙකු වෙනුවෙන් සේවක භාරකාර අරමුදල් 2014 මැයි සිට සැප්තැම්බර් දක්වා නියමිත දිනයේදී දායක මුදල් නොගෙවීමෙන් දඩ මුදල් වශයෙන් රු. 17,079 ක් එම අරමුදලට ගෙවා තිබුණි.

## 4 නිෂ්ක්‍රීය වත්කම්

### 4.1 පොළ ගොඩනැගිල්ල ඉදිකිරීම

පුරනැගුම වැඩසටහන යටතේ රු. 23,515,530 වැයකර ඉදිකර තිබූ ගොඩනැගිල්ල 2012 සැප්තැම්බර් 26 දින සභාවට භාරදී තිබුණද එය අද දක්වා අදාල අරමුණ සඳහා යොදවා ගැනීමකින් තොරව නිෂ්කාර්යව තිබුණි.

## 5 මානව සම්පත් කළමනාකරණය

2015 දෙසැම්බර් 31 දිනටවූ අනුමත සේවක සංඛ්‍යාව සහ තත්‍ය සේවක සංඛ්‍යාව සම්බන්ධ විස්තර පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තත්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|
| විධායක | 05 | 05 | - | - |
| සහායක | 27 | 23 | 04 | - |
| සුළු සේවක | 61 | 84 | - | 23 |
| වෙනත් | - | 26 | - | 26 |

කළමනාකරණ සහායක තනතුරේ පුරප්පාඩු හතරක් ඉකුත් වර්ෂ 05 ක සිට පුරවා නොතිබුණි.

## 6 පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරවනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) කොන්ත්‍රාත් පාලනය

(ඇ) වාහන උපයෝජනය

(ඈ) ආදායම් අයකිරීම්